# දම්පල් ආදි සිසුන් හට විරු හරසර දැක්වූ 2009 නොවැම්බර් මස 12 වන දින මේජර් ජෙනරාල් කමල් ගුණරත්න පැවැත්වූ කථාවෙනි.

මෙරට ඉතිහාසයේ දීර්ඝතම අභ්‍යන්තර වාර්ගික අරගලය ලෙස සැලකෙන උතුරු - නැගෙනහිර එල්. ටී. ටී. ඊ. සංවිධානයට එරෙහි මානුෂික මෙහෙයුම පසුගිය 2009 මැයි 19 දින නන්දිකඩාල් කලපුව අසල දී සාර්ථකව නිමා කෙරුණි. ඒ වෙලුපිල්ලේ ප්‍රභාකරන් නම් රුදුරු ත්‍රස්ත නායකයා සඳහටම නිහඬ කිරීමෙනි.

විශ්වයම විශ්මිත කළ මේ මානුෂික මෙහෙයුමේ දී අප ත්‍රිවිධ හමුදාවත්, පොලිස් සේවාවත් තම මව්බිම වෙනුවෙන් ඉටුකළ උදාරතර මෙහෙය මිනිසත් බව ලද මිනිසුන් විසින් තම ජීවිත කාලයේ දී ඉටුකළ හැකි යුතුකම් අතරින් උදාරතම යුතුකම වනවාට කිසිදු සැකයක් නොමැත. එසේම තම මව්බිම වෙනුවෙන් ඉටුකළ හැකි උපරිම උත්තරීතරම සේවය ලෙස ද මෙය රන් අකුරින් සටහන් වනු ඇත.

තමන් සිප් සතර හැදෑරූ විදුහල් මෑණියන් වෙතින් මෙවන් උතුම් හරසර ලැබීම කෙනෙකුට උදාවන දුර්ලභ අවස්ථාවක් වන අතර, එවැනි හරසර ලැබීමට තරම් පින් කර ඇති අප සැවොම දෙවියන් විසින් දෙන ලද වරමක් ලෙස සලකන්නෙමු.

බෙදුම්වාදී ත්‍රස්තවාදය තුරන් කිරීම පිණිස වූ මෙම අරගලයේ දී උපන් දේශය වෙනුවෙන් සතුරා අභිමුව අභීතව සටන් කොට දිවි පිදූ හා අත් පා අහිමිව ආබාධිතව සටන් කළ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවයේ සියලුම නිලධාරින් හා සෙසු නිලයන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරමු. එමෙන්ම මව්බිම වෙනුවෙන් සිය ජාතික මෙහෙවර ඉටුකළ විශ්‍රාමික සියලුම නිලධාරින් හා දැනට සේවයේ නියුතු සියලුම නිලධාරින්, ඔවුන් මෙලොවට බිහිකළ මව් වරුන් හා කරදඬු උස් මහත් වන තෙක් හැදූ පියවරුන් හා සිප් සතර දුන් ගුරු මව්වරුන් හා ගුරු පියවරුනුත්, ඔවුන් නිතරම දිරිමත් කළ විහාරමහාදේවියට සමකල හැකි සෙනෙහෙබර බිරින්දෑවරුන්, බොහෝ විට පිය උණුසුම නො ලද එහෙත් පිය සෙනෙහස පමණක් විඳි දුවා දරුවන් හට අපගේ උත්තමාචාරය පුද කරමු.

දම්පල් විදුහලේ ආදරණීය දූ දරුවනි. මගේ කතාවේ මීලඟ කොටස ඔබ වෙනුවෙනි. දම්පල් මෑණියන්ගේ තුරුලේ ශිල්ප හැදෑරූ අප හට ඔබ වෙනුවෙන් කිවයුතු විශේෂ කරුණක් ඇත. මා තුන්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටි අවධියේ පාසල ඇරී අප නිවස බලා යන වෑන් රථය පැමිණෙන තෙක් රැඳී සිටි අවස්ථාවක දී අද මෙහි පැමිණ සිටින අපගේ ජ්‍යේෂ්ඨ නිලධාරි බ්‍රිගේඩියර් වසන්ත බණ්ඩාර එදා ශිෂ්‍ය භට කණ්ඩායමේ නායකයා ලෙස සිය ශිෂ්‍යභට කණ්ඩායම සමග යුධ හමුදා සරඹවල යෙදී සිටිනු දුටුවා. යුධ හමුදාවට එක්වීමට ප්‍රථම සිතිවිල්ල මා තුල පහලකල එම දර්ශනය අදත් මගේ මතකයට නැගෙනවා.

මගේ පාසල් දිවිය තුල මා දුටු ජෙනරාල් රොහාන් දළුවත්ත වැනි ජ්‍යේෂ්ඨයන් හමුදාව තුළ සිටිනු දැකීමෙන් ඒ පිළිබඳ උනන්දුව තවත් වර්ධනය කළා.

මා විසින් අණදුන් 53 වන සේනාංකයේ වීර සෙබලුන් විසින් වසර 30 ක් තිස්සේ රට අඳුරු ආගාධයකට ඇද දැමූ ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් බිහිවූ කෲරතම, පාපතරම මිනිසා වූ වේලුපිල්ලේ ප්‍රභාකරන් මරා දමා ඔහුගේ මළ සිරුර ගෙනවිත් මා දෙපා මුල අතහැරි විට එම වීරොධාර සෙබලුන්ගේ නායකයා ලෙසත් උපන් දේශයේ පුත්‍රයෙකු ලෙසත් මා ලැබූ ආත්ම තෘප්තිය විස්තර කිරීමට මා ලඟ වචන නැත.

යමෙකුට එවන් අභිමානයක් ලැබීමට නම් හමුදා සේවයට එක්වීම හැර වෙනත් විකල්පයක් නැත. අද උපහාර ලබන අප සැවොම දේශය වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් ඉටුකර ඇතැයි මා තරයේ විශ්වාස කරමි. ගායක අබේවර්ධන බාලසූරිය මහතා ගායනා කල ගීතයක කොටස් මේ සඳහා හොඳම උදාහරණය ලෙස අප සැවොම පිළිගනු ඇතැයි මා අපේක්ෂා කරමි.

අවසන් හුස්ම පොද නොබියව හෙලන්නට<br>
සිව්රියනේ සිට සතුටින් නිදන්නට<br>
මිනිසෙකු විලස ඉපදුනු ඵල ලබන්නට<br>
පුළුවනි මරණ මංචකයේ වුවද මට

ඉතින් දූ පුතුනි අපගේ නායකත්වය ඉදිරියට ගෙනයාම දම්පල් මෑණියන්ගේ දරුවන් වූ ඔබ සතුය.මාගේ හදවතේ හැමදාමත් නිම්නාද දෙන්නාවූ මා ඉගෙනගත් 3 සී පන්තියේ පන්තිභාර ගුරුතුමිය වූ සෝමා රණවීර ගුරුමෑණියන් අපට ඉගැන්වූ ටිබෙට් ජාතික එස් මහින්ද හිමි විසින් රචිත එක කවියක් මෙසේ සඳහන් කරමි.

ජාතිය රන් විමණක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගැනුමට මෙලොවේ
සමත් වුවොත් පුත නුඹ වේ